**ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2025**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ක්‍රියා කර ඇති බව,

- ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,408,641 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 32,150,386 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,741,745 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් හා වේතන වියදම් සහ අධ්‍යයන වැඩසටහන් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණු සීදුව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා 2025 වර්ෂය සඳහා රු. 180,000,000 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු. 29,570,000 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වසර 08 ක් ගතවී තිබුණද, රු. 1,001,310,000 ක් වැය කර ඉදිකර තිබූ ගොඩනැගිලි සංකීර්ණයේ වැඩ සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ආයතනයේ කර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සැපයීමට අපොහොසත් වී තිබුණි. | සීදුව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා අනුමත මූලික වැය ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිපාදන වලින් 2025 වර්ෂය සඳහා ඉතිරිව තිබුනේ රු.මිලියන 97.85 පමණි. එම ප්‍රතිපාදන මගින් 2025 වර්ෂය තුළ මූලික වැය ඇස්තමේනතුවට අනුව ශ්‍රවණාගාරයේ ඉදිකිරීම්, අරක්‍ෂන කුටිය හා ඉදිරිපස තාප්පය, CCTV කැමරා ස්ථාපිත කිරීම යනාදි වැඩ කොටස් සිදු කළ යුතුව තිබුණු බව. මෙම වැඩ කොටස් අතරින් වැඩ අවසන් කල කොටස් සඳහා 2025 වර්ෂය තුල රු.මිලියන 29.57 රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවීම් සිදුකරන ලද බව. 2025 වර්ෂය සඳහා වෙන්කරන ලද රු.මිලියන 180 ප්‍රතිපාදන අතර, මිලියන 30 ක් ශ්‍රවණාගාරය සඳහා පුටු මිලදී ගැනීම හා මිලියන 86.86 ක් අත්‍යවශ්‍ය අමතර ඉදිකිරීම් සඳහා වන | වෙන් කරන ලද ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර අදාල කාලය තුළ ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

බව.මෙම අමතර මිළදී ගැනීම් හා ඉදිකිරීම් සියල්ල මූලික වැය ඇස්තමේන්තුවේ සඳහන් කර නොමැති නමුත් අත්‍යාවශ්‍ය ඒවා වේ. මේ සඳහා ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන 116.86 කි. 2025 වර්ෂය වෙනුවෙන් ලබා දී තිබූ රු.මිලියන 180 ක ප්‍රතිපාදන වලින් වියදම් දැරීමට හැකිවූයේ රු.මිලියන 29.57 ක් පමණි.

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් 2024 සැප්තැම්බර් 4 හා 5 දිනයන්හි පැවති සමාජ වැඩ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා දේශීය හා විදේශීය පුද්ගලයින් 228 දෙනෙකු සහභාගි වී තිබුණු අතර ඒ සඳහා ගාස්තු අයකිරීම ආයතනයේ මුදල් අයකැමි නිලධාරී සිටියදී පර්යේෂණ අංශයේ අධ්‍යක්ෂ විසින් සිදුකර සම්මන්ත්‍රණය සඳහා අය කරන ලද රු.90,000 ක මුදල හා L/23 ලදුපත් මඟින් අය කරන ලද ඇ.ඩොලර් 150 ක් ඔහු විසින් පෞද්ගලිකව රුපියල් බවට පරිවර්තනය කර 2024 සැප්තැම්බර් 11 දින රු.150,000 ක් මුදල් අයකැමි වෙත භාර දී තිබුණි. | 2024 වර්ෂයේදී පැවති සමාජ වැඩ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය වෙනුවෙන් රු.548,420.16 ක මුදලක් ආයතනයට ලැබී තිබුණි.<br>පර්යේෂණ අංශය මගින් 2024 සැප්තැම්බර් 04 හා 05 දෙදින පවත්වන ලද සමාජ වැඩ 3 වන සම්මන්ත්‍රණය සඳහා පැමිණි විදේශීය ජාතිකයින් විසින් ආයතනයට ගෙවීම් කරන ලද මුදල් අතර L/23-434152 මගින් ඩොලර් 100 ක් ද L/23-434157 මගින් ඩොලර් 50 ක් ද ලෙස ලබාගෙන ඇත.එම ලබාගත් ඩොලර් ආයතනයේ ඩොලර් ගිණුමක් නොමැතිවීම හේතුවෙන් ඩොලරයේ අගය රු. 300 බැගින් පෞද්ගලිකව මාරුකර ඩොලර් 150 ක් සඳහා රු 45,000 ක් ද සමගින් සම්මන්ත්‍රණයට සහභාගීවූ විදේශිකයන් 7 දෙනෙකු වෙනුවෙන් රුපියල් 105,000ක් ද සමගින් රුපියල් 150,000ක් 2024.09.11 දින පස්වරුවේ ගිණුම්ගත කිරීම සඳහා ආයතනයේ ගිණුම් අංශයට භාරදී ඇත. | අදාළ කාර්ය මූල්‍ය පාලන බලතල වලට අනුකූලව විනිවිදභාවයකින් යුතුව සිදුකළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.2 ,230,000 ක් වූ ලැප්ටොප් පරිගණක 10 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී 2024 භාණ්ඩ,වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 (ඈ), 2.3, 2.4 (ඇ) , 2.5 , 4.1.1, 4.1.2 හා 4.1.3 ඡේද සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 2.4 (ආ) (X) , 2.7.4 (ආ) 2.7.4(ඉ)(III), 04 (ඇ) ඡේදයේ ඇමුණුම් I,II,III සහ 5.2 ඡේද අනුගමනය කර නොතිබුණි. | ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු අනිවාර්ය ප්‍රකාශය ලංසුව සමග මින් ඉදිරියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව ඉදිරියේදී ප්‍රසම්පාදන කළමනාකරණ අංශය පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. | ප්‍රසම්පාදන කටයුතු වලට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීමට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට වග බලා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව ගොඩනැගිලි හා වාහන අලුත් වැඩියා සඳහා රු.මිලියන 07 ක් හා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 43 ක් ප්‍රතිපාදන ලැබී තිබුණද, ප්‍රගතිය පිළිබඳ වාර්තා අනුව වාහන අලුත් වැඩියාවෙන් සියයට 55ක ප්‍රමාණයක්ද ,ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම් වලින් සියයට 47 ක ප්‍රමාණයක්ද, ඉටු කර තිබුණි.ඒ සඳහා රු.මිලියන 23.95ක් වැයකර තිබුණු අතර මුළු ප්‍රතිපාදනයෙන් සියයට 48ක් පමණක් වැයකර තිබුණි.<br>ඒ අනුව ප්‍රාග්ධන උපකරණ අවශ්‍යතා නියමිත වේලාවට සපුරාලීමට කටයුතු නොකිරීමෙන් පාඨමාලා වල ගුණත්වය පාඨමාලා හදාරන ශිෂ්‍ය ප්‍රජාවට අවශ්‍ය පහසුකම් සපුරාලීම නිසි පරිදි ඉටු වී නොතිබුණි. | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව පුනරුත්තාපාන වියදම් සඳහා රු.මිලියන 7ක් සහ ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා මිලියන 43 ක් වෙන් කර ඇත. එයින් රු. මිලියන 23.5 ක් වැය කර තිබුණු බව හා ප්‍රසම්පාදන සැලැස්මට අනුව අධ්‍යයන කටයුතු වලට අදාලව මිලදී ගැනීම් සියල්ල (පුස්තකාල පොත්, පරිගණක හා සුහුරු පුවරු (Smart Board)) රු.මි. 23.95 න් මිලදී ගැනීම් සිදුකර අවසන් කර ඇති බව. | වාර්ෂිකව සැලසුම් කරන ලද කාර්යයන් ඉටු නොකිරීමට හේතු සොයා බැලිය යුතු අතර,ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් නොවීමට ක්‍රියාකාරී සැලසුම් තාත්විකව සකස් කිරීමට වග බලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාජ සංවර්ධන ආයතනයේ අරමුදලින් රු.මිලියන 06 ක වාහන 08 ක් කාර්යාල උපකරණ 13, වායුසමීකරණ යන්ත්‍ර 09 ක් හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන 02 ක පුනරුත්ථාපන වැඩිදියුණු කිරීම් සැලසුම් කර තිබුණද, වර්ෂය තුළ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි. | වාහන හා කාර්යාල උපකරණ සම්බන්ධව තාක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා සුදුසුකම් ලත් තාක්ෂණ නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීමේ ගැටලු සහගත තත්ත්වය හේතුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කළ නොහැකි විය.<br>ප්‍රාදේශීය මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීමට භාණ්ඩාගාර මුදල් ප්‍රමාණවත් වීම හේතුවෙන් ආයතනයේ අරමුදල් යොදා නොගන්නා ලද බව. | වාර්ෂිකව සැලසුම් කරන ලද කාර්යයන් ඉටු නොකිරීමට හේතු සොයා බැලිය යුතු අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් නොවීමට ක්‍රියාකාරී සැලසුම් තාත්විකව සකස් කිරීමට වග බලා ගත යුතුය. |
| (ඇ) | සමස්තයක් ලෙස රු. මිලියන 27.63 ක් වූ අරමුදලේ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂයේ ඉටුකර තිබුණේ රු. මිලියන 3.07 ක කාර්යයන් පමණක් විය. එනම් මූල්‍ය ප්‍රගතිය සියයට 11 ක් හා භෞතික ප්‍රගතිය සියයට 18 ක් පමණ විය. ඒ අනුව අරමුදලේ අපේක්ෂිත කාර්යයන් නිසි පරිදි ඉටුවී නොතිබුණි. | ආයතන අරමුදලින් වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මි.27.63 කින් 8.5 ක් පුනරුත්තාපන හා අත්පත්කර ගැනීම් සඳහා වුවද ප්‍රතිපාදන වියදම් නොවුණු බව ඉතිරි මුදල වන රු.මි.19.13 ක් අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ බව.<br>එම ප්‍රතිපාදන වලින් පුස්තකාලය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථානය හා තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මි.3.07 ක් වියදම් වී ඇති බව. ඉතිරි මුදල වන රු.මි. 16. 06 ඇතුලත රු.මි. 13.39 ක් තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ වියදම් සඳහා වෙන් කර තිබුණද තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය වෙත පැවරී තිබූ ප්‍රධාන කාර්යය වූයේ පාඨමාලා සමාලෝචනයක් සිදුකිරීම බව. | ප්‍රතිපාදන උපයෝජනය නොකිරීමට හේතු සොයා බැලිය යුතු අතර, ඉදිරියේදී අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රතිපාදන වෙන්කර ඉන් අදාල කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තත්ත්ව කළමනාකරණ අංශය විසින් ආයතන වැඩසටහන් වල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් 6 ක් හා වැඩමුළු 6 ක් පැවැත්වීමට රු. මිලියන 4 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, රු. මිලියන 0.20ක් වැයකර වැඩමුළු 02ක් හා වැඩසටහන් 03ක් පමණක් සිදුකර තිබුණි.ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 5 ක් ද භෞතික ප්‍රගතිය සියයට 58ක් ද විය.ඒ අනුව ඉන් අපේක්ෂිත ආයතනයේ සියළුම වැඩසටහන් වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට සැලසුම් කල කාර්යයන්ගෙන් ඉටු වී තිබුණේ සියයට 58 ක් පමණි. | විශ්වවිද්‍යාල අනුබද්ධ කිරීමේ කටයුතු නිසා පාඨමාලා සමාලෝචන කාර්යයන් සිදුකිරීම SCAQA විසින් කල් දමන ලද බව. ඒ සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතු මණ්ඩලය (AAB) සහ පාලක සභාව මගින්ද තහවුරු කර ඇති බව. මෙම තත්ත්වය මත තත්ත්ව සහතික කිරීමේ ඒකකය වෙත වෙන් කර ඇති මුදල් ආයතනයෙහි වෙනත් කටයුතු සඳහා යොදවා ඇති බව. | සැලසුම් කරන ලද වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කර වැඩසටහන් අපේක්ෂිත පරිදි පවත්වා නොතිබීමට හේතු සොයා බැලිය යුතු අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් නොවීමට සැලසුම් තාත්වික පදනමින් සැකසිය යුතුය. |